සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved


# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

13 ශ්‍රේණිය | නාට්‍ය හා රංගකලාව | පිළිතුරු පත්‍රය

## I කොටස

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01. (1) | 02. (4) | 03. (2) | 04. (4) | 05. (2) | 06. (1) | 07. (3) | 08. (1) | 09. (2) | 10. (2) |
| 11. (1) | 12. (2) | 13. (3) | 14. (2) | 15. (2) | 16. (4) | 17. (1) | 18. (2) | 19. (3) | 20. (2) |
| 21. (1) | 22. (2) | 23. (3) | 24. (2) | 25. (1) | 26. (4) | 27. (3) | 28. (2) | 29. (2) | 30. (1) |
| 31. (3) | 32. (1) | 33. (1) | 34. (3) | 35. (1) | 36. (3) | 37. (1) | 38. (3) | 39. (3) | 40. (1) |

(ලකුණු 40)

## II කොටස

01. (i) ප්‍රසංගාත්මකව නැරඹිය හැකිය. / සජීවීව ඉදිරිපත් කෙරෙන කලාවකි. / ප්‍රේක්ෂකයන් ඉදිරියේ ඉදිරිපත් කරයි. / නිශ්චිත කාල පරාසයක් යොදාගනී. / විනෝදාස්වාදය ප්‍රධාන අරමුණ වෙයි. / ඉදිරිපත් කරන මොහොතේ දී පමණක් පවතී. / සතර අභිනය භාවිතා කරයි. (ල. 4)

(ii) සංගීතය, බැලේ, ඔපෙරා, මුද්‍රා නාට්‍ය ආදිය ප්‍රාසාංගික කලාවට අයත්ය. මෙම අංගයන්ගෙන් නාට්‍ය කලාව වෙනස්වනයුරු දෙකක්වත් සඳහන් කොට තිබීම. (ල. 5)

(iii) විවිධ කලාකරුවන් රැසකගේ දායකත්වයෙන් නාට්‍යයක් ගෙන එනු ලබයි. මෙකී කාර්ය විකාශනයේදී ඒකාකාරී බවෙන් මුදවා ප්‍රේක්ෂකයා ආනන්දයට පත් කිරීමේ කාර්යට අධ්‍යක්ෂ ප්‍රමුඛ අනුශාංගික ශිල්පීන් රැසකගේ දායකත්වය අත්‍යවශ්‍ය වෙයි. මෙහි වූ ශිල්පීන්ගේ කාර්යභාරය විස්තර කොට දක්වා තිබීම. (ල. 6)

02. (i) නාට්‍යධර්මී — අසාමාන්‍ය සංවාද, රඟපෑම්, භාව නිරූපණය ලාලිත්‍යයෙන් යුතු අංගහාර හා අභිනයෙන් යුක්ත, අලංකාර, අස්වාභාවික ලෙස හැසිරෙන නළු නිළියන් ඇති යම් නාට්‍යයක් වේද එය නාට්‍ය ධර්මී වේ.

ලෝකධර්මී — ලෝකයේ පැවැත්ම හා ක්‍රියාවන් ලාලිතායෙන් යුතු අංගචලන හා අභිනයන්ගෙන් යුක්තව නළු නිළියන් හැසිරෙන්නා වූ නාට්‍ය නිර්මාණ ලෝක ධර්මී වේ. (ල. 4)

(ii) වාචික අභිනය — දර්ශන පසුතල පරිසරය ආදිය වචන මගින් මවා පායි.

ආංගික අභිනය — චාරි, ස්ථානක, හස්ත හා කරණ වශයෙන් ප්‍රභේද දක්වා ඇත.

සාත්වික අභිනය — ස්ථම්භ, රෝමාංච, වේපථු, ස්වරභංග, ස්වේද, අශ්‍රු, වෛවර්ණ්‍යය ප්‍රලය ලෙස සාත්ත්වික බාව 08 ක් දක්වා ඇත.

ආහාර්ය අභිනය — පුස්ත, අලංකාර ලෙස නාට්‍ය ධර්මී රංග ශෛලීයේ දක්වා ඇත.

මේ පිළිබඳව කෙටියෙන් දක්වා තිබීම. (ල. 5)

(iii) වර්තමානයේ ඕනෑම නාට්‍යයක ලෝකධර්මී හා නාට්‍ය ධර්මී රංග ශෛලිය දැකිය හැකිය. නාට්‍යයක් නිදසුන් ලෙස ගනිමින් පිළිතුරු තහවුරු කර තිබීම. (ල. 6)

03. (i) පෙළ රචනයේදී නාට්‍යධර්මී හා ලෝක ධර්මී ශෛලීන් දෙකම යොදාගෙන තිබීම. දේශපාලන, සමාජීය ගැටුම්, පුද්ගල ගැටුම් වර්තමානයට ගැළපෙන ලෙස විවරණය කිරීම. විශිෂ්ඨ චරිත නිරූපණය, කාව්‍යමය සංවාද ආදිය දක්වා තිබීම. (ල. 4)

(ii) පාලන තන්ත්‍රය ක්‍රියාත්මක වීමේදී රජුට එකහෙලා ආමාත්‍ය මණ්ඩලයේ අදහස් උදහස් ප්‍රතික්ෂේප කිරීමට හැකි නොවීම, විකටයින් මෙන් හැසිරෙන අමාත්‍ය මණ්ඩලය, පරම්පරාගත ආකල්ප වෙනස් නොවීම......... ආදිය මගින් පිළිතුර තහවුරු කිරීම. (ල. 5)

(iii) භාෂාව නිර්මාණශීලීව යොදාගෙන තිබීම. ඓතිහාසික කතා වස්තුවක් වර්තමානයට ගැලපෙනායුරින් නිර්මාණය කිරීම. ඔහුගේ මාක්ස්වාදී දර්ශනයේ සලකුණු, සමාජයේ විවිධ මිනිසුන්ගේ ආකල්ප, තීරණ ආදිය මගින් පිළිතුරු තහවුරු කිරීම. (ල. 6)

04. (i) හෙරින්ක් ඉබ්සන්, ඇන්ටන් චෙකොෆ්, සැමුවෙල් බෙකට්, බර්ටෝල්ට් බ්‍රෙෂ්ට්. (ල. 4)

(ii) තෝරාගත් නාට්‍යකරුවා හා නිර්මාණයයන් විමර්ශනය තර්කාණුකූලව පිළිතුරු ගොනු කොට තිබීම. (ල. 5)

(iii) කාන්තා විමුක්තිය පිළිබඳ ගැටලුව නෝරාගේ චරිතයෙන් පිළිබිඹු වන බව, පෞද්ගලික නිදහස වෙනුවෙන් ක්‍රියාකරන්නියක් ලෙසද, ආර්ථික අපහසුතා මැද නූතන සමාජයේ වෙසෙන පවුල් සංස්ථාව තුළ මතුවන ගැටලුකාරීත්වය ස්වාමියාගෙන් ලැබිය යුතු ආදර රැකවරණය, ආත්ම ශක්තිය, ස්වාමිභක්තිය, දරු ස්නේහය............ ආදිය තර්කානුකූලව ලියා තිබීම. (ල. 6)

05. (i) ක්‍රිස්තු ධර්මය ප්‍රචාරය කිරීම සඳහා.
බැතිමතුන්ගේ ආගමික භක්තිය වැඩි කිරීම සඳහා
දේව මෙහෙයන් ඉදිරිපත් කිරීම සඳහා (ල. 4)

(ii) මිස්ටරි අද්භූත ජනක නාට්‍ය
මිරැකල් ප්‍රාතිහාර්ය
මොරලිටි සදුපදේශ
නාට්‍ය විස්තර කොට තිබීම. (ල. 5)

(iii) පළමුව පල්ලිය ඇතුළත පල්ලියෙන් පිටත ප්‍රධාන දොරටුව අභියස රඟ දැක්වීම. පසුව තාවකාලිකව සකස් කරනලද වේදිකා මත, සංදර්ශනය කරත්ත මත, මිස්ටරි නාට්‍ය ගල්වලින් තැනූ අර්ධකවාකාර වේදිකා මත මුල් කාලයේ රඟ දැක් වූ අතර, පසුව සංචාරක නාට්‍ය කණ්ඩායම් ලෙස නගරයේ තැනින් තැනට ගොස් රඟ දැක්වීය. (ජංගම වේදිකා) සදාචාර නාට්‍ය වලදී ප්‍රභූ පැලැන්තියට ගෝචර වන ලෙස, රඟහල්වල වේදිකා ගත කෙරුණි. (ල. 6)

06. (i) උඩරට කොහොඹා කංකාරිය, කඩවත් කංකාරිය
පහතරට දෙවොල් මඩු, දහඅට සන්නිය, රිද්දියාගය, සූනියම් යාගය, ගරා යැකුම
සබරගමු පහන්මඩු, කිරිමඩු, පුනාමඩු (ල. 4)

(ii) ඕනෑම ශාන්ති කර්මයක අන්තර් රංගාවස්ථව ලියා දක්වා තිබීම. (ල. 5)

(iii) සශ්‍රීකත්වය, රෝග නිවාරණය, බවභෝග සම්පත් දියුණු කරගැනීම, ගර්භ සංරක්ෂණය, දරුවන් බිහි කිරීමේ දී ආශිර්වාදය, බිහිකළ දරුවාට ආරක්ෂාව, වස්දොස් දුරු කරලීම, යක්ෂ භය දුරු කිරීම, දෙවි දේවතාවුන්ගෙන් පිහිටාරක්ෂාව ආදිය ලියා දැක්වීම. (ල. 6)

The National e-Learning Portal for The General Education